සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உ யர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2017**

| | | | |
|---|---|---|---|
| ගිණුම්කරණය II<br>கணக்கீடு II<br>Accounting II | 33 S II | | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස් :**

* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **හයකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමග අමුණන්න.

**1.** සීමිත ඩිලාර පොදු සමාගම නිෂ්පාදන සහ වෙළෙඳ සමාගමකි. තම නිෂ්පාදිතවලට අමතරව, එය වෙනත් ආයතනවලින් මිල දී ගත් භාණ්ඩ ද අලෙවි කරයි. 2017.03.31 දිනට සමාගමේ සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම | 27 500 | |
| නිෂ්පාදිත භාණ්ඩවල පිරිවැය | 12 000 | |
| භාණ්ඩ ගැනුම් | 6 000 | |
| 2017.03.31 දිනට අමුද්‍රව්‍ය තොගය | 2 000 | |
| 2016.04.01 දිනට භාණ්ඩ තොගය | 3 000 | |
| බෙදාහැරීමේ පිරිවැය | 8 000 | |
| පරිපාලන වියදම් | 8 400 | |
| ගැනුම් හා වියදම් මත ගෙවූ එකතු කළ අගය මත බදු (VAT) | 2 300 | |
| බැංකු ණය මත ගෙවූ පොලී | 200 | |
| ගෙවූ ආදායම් බදු | 1 900 | |
| ගෙවූ ලාභාංශ | 1 700 | |
| බැංකු සහ මුදල් | 6 000 | |
| විකුණුම් | | 43 000 |
| විකුණුම් මත එකතු කළ VAT | | 2 800 |
| බැංකු ණය | | 12 000 |
| 2016.04.01 දිනට ආදායම් බදු වෙන් කිරීම (2016.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා) | | 800 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 15 000 |
| 2016.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 5 400 |
| | **79 000** | **79 000** |

**අතිරේක තොරතුරු:**

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දැ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) 2017.03.31 දිනට භාණ්ඩ තොගවල පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පහත පරිදි විය.

| | **පිරිවැය (රු.)** | **ශුද්ධ උපලබ්ධි අගය (රු.)** |
|---|---|---|
| නිෂ්පාදිත භාණ්ඩ | 1 000 000 | 1 200 000 |
| මිල දී ගත් භාණ්ඩ | 1 300 000 | 1 000 000 |

තොග අගය කිරීමේ දී නිෂ්පාදිත භාණ්ඩ සහ මිල දී ගත් භාණ්ඩ වෙන් වෙන්ව සලකා බලයි.

(ii) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන ගාස්තුව රු. 600 000 ක් වන අතර එයින් රු. 400 000 ක් වර්ෂය තුළ දී ගෙවන ලදී. මෙම ගෙවූ මුදල පමණක් පරිපාලන වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

(iii) ප්‍රවර්තන වර්ෂය තුළ දී අධ්‍යක්ෂ පාරිශ්‍රමික ලෙස රු. 2 200 000 ක් ගෙවා එය පරිපාලන වියදමක් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වුව ද, ප්‍රවර්තන වර්ෂයට අදාළ අධ්‍යක්ෂ පාරිශ්‍රමික රු. 1 800 000 ක් විය.

(iv) ආදායම් බදු ගෙවීම් තුළ පසුගිය වර්ෂය සඳහා ගෙවූ රු. 900 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා කළ ගෙවීම් ඇතුළත් වේ. ප්‍රවර්තන වර්ෂයේ අවසාන කාර්තුවේ ආදායම් බදු වගකීම රු. 500 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම වටිනාකම මෙතෙක් ගළපා නොමැත.

[ දෙවැනි පිටුව බලන්න.

(v) 2017.03.31 දිනට දේපළ, පිරියත සහ උපකරණ සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය පහත පරිදි විය.

| **විස්තරය** | **පිරිවැය/වටිනාකම (රු.'000)** | **සමුච්චිත ක්ෂය (රු.'000)** | **ධාරණ වටිනාකම (රු.'000)** |
|---|---|---|---|
| ඉඩම (2016.04.01 දිනට) | 10 000 | – | 10 000 |
| පිරියත සහ යන්ත්‍ර | 21 000 | 9 700 | 11 300 |
| මෝටර් රථ (බෙදා හැරීමේ වෑන් රථ) | 4 000 | 2 000 | 2 000 |
| ලී බඩු සහ සවි කිරීම් | 7 000 | 2 800 | 4 200 |
| **එකතුව** | **42 000** | **14 500** | **27 500** |

ඉඩම ප්‍රත්‍යාගණන අගයට ද අනෙකුත් සියලු වත්කම් පිරිවැයට ද මනිනු ලැබේ.

2017.03.31 දින ඉඩම රු. 12 000 000 කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලද නමුත් එය මෙතෙක් සටහන් කර නොමැත. මෙම වත්කම පසුගිය වර්ෂයේ ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කිරීම තුළින් රු. 1 200 000 ක ඌනතාවක් වාර්තා කර ඇත.

(vi) දේපළ, පිරියත සහ උපකරණ (ඉඩම හැර) වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය වෙන් කර ඇත. කෙසේ වුව ද, බෙදා හැරීමේ වෑන් රථවල ඉතිරි ඵලදායී ජීව කාලය වර්ෂ 8 ක් ලෙස 2016.04.01 දින කරන ලද සංශෝධනය ප්‍රවර්තන වර්ෂයේ ක්ෂය වෙන් කිරීමේ දී සැලකිල්ලට ගෙන නොමැත. (බෙදා හැරීමේ වෑන් රථවල සුන්බුන් අගයක් නොමැති බව උපකල්පනය කරන්න.)

(vii) 2016.04.01 දින වර්ෂ 5 ක කාලයක් සඳහා මූල්‍ය කල්බදු පදනමට ලොරියක් අත්පත් කර ගන්නා ලදී. එහි සාධාරණ අගය රු. 5 000 000 ක් විය. මෙම වත්කමෙහි අයිතිය කල්බදු කාලය අවසානයේ දී සමාගමට මාරු වනු ඇත. පළමු වර්ෂයට සහ දෙවන වර්ෂයට අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 500 000 ක් සහ රු. 418 000 ක් වන අතර ඉතිරි වර්ෂ තුන සඳහා අදාළ මුළු කල්බදු පොලිය රු. 682 000 ක් වේ. වාර්ෂික කල්බදු වාරිකය රු. 1 320 000 කි. එය වර්ෂය අවසානයේ දී ගෙවා ඇති අතර බෙදා හැරීමේ පිරිවැයක් ලෙස සටහන් කර ඇත. මෙම ගනුදෙනුවට අදාළ වෙනත් කිසිදු සටහනක් කර නොමැත.

(viii) වර්ෂය තුළ දී රු. 5 000 000 ක සාමාන්‍ය කොටස් නිකුත් කරන ලද අතර මෙම මුදල සම්පූර්ණයෙන් ලැබුණි. එම මුදල විකුණුම් ගිණුමෙහි සටහන් කර ඇත.

(ix) 10% ක වාර්ෂික පොලියට 2017.01.01 දින බැංකු ණය ලබා ගෙන ඇත. මෙම ණය මුදල පියවීම ආරම්භ වනුයේ වර්ෂ දෙකකට පසුව ය. කෙසේ වුව ද, මේ සඳහා පොලිය ආරම්භයේ සිට ම ගෙවිය යුතු වේ. මාස 2 ක පොලිය පමණක් ගෙවා ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත ඩිලාර පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2017.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

**(මුළු ලකුණු 20 යි)**

**2.** (අ) අමල්, කමල් සහ නිමල් පහත එකඟතා යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ.

- ආරම්භක ප්‍රාග්ධන ශේෂ මත 10% ක වාර්ෂික පොලියකට සෑම හවුල්කරුවකු ම හිමිකම් ලබයි.
- අමල්, කමල් සහ නිමල් පිළිවෙළින් ලාභාලාභ 3:2:1 අනුපාතයට බෙදාගනු ලබයි.

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ කෙටුම්පත් ආදායම් ප්‍රකාශනයට අනුව ලාභය (හවුල්කරුවන්ට බෙදා හැරීමට පෙර) රු. 3 400 000 ක් විය. කෙසේ වුව ද, ව්‍යාපාරයේ ගිණුම් වාර්තාවල පහත වැරදි පසුව හෙළිදරව් විය:

(i) සේවක වැටුප් රු. 360 000 ක් වැටුප් ගිණුමට රු. 630 000 ක් ලෙස හර කර ඇත.

(ii) බැංකු ණය මත ගෙවූ රු. 100 000 ක පොලිය, පොලී ආදායම් ගිණුමට රු. 10 000 ක් ලෙස බැර කර ඇත.

(iii) 2016.04.01 දින රු. 300 000 ක වටිනාකමට මිල දී ගත් කාර්යාල උපකරණ, කාර්යාලීය වියදම් ලෙස සටහන් කර ඇත. (කාර්යාල උපකරණ වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබයි.)

(iv) රු. 150 000 ක් වූ අමල්ගේ වාර්ෂික ජීවිත රක්ෂණ වාරිකය, ව්‍යාපාරය විසින් ගෙවා එය ව්‍යාපාරයේ රක්ෂණ වියදම් ලෙස සලකා ඇත.

2017.03.31 දින අමල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදින හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කීර්තිනාම ගිණුමක් පොත්වල පවත්වා නොගන්නා අතර සියලු ම ගැළපුම් හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් සිදු කරනු ලබයි. අමල්ට ගෙවිය යුතු මුදල හවුල් ව්‍යාපාරයේ ණයක් ලෙස පවත්වාගෙන යාමට එකඟ විය. කමල් සහ නිමල් පිළිවෙළින් ලාභාලාභ 2:1 අනුපාතයට බෙදා ගනිමින් ව්‍යාපාරය පවත්වාගෙන යාමට එකඟ විය.

2016.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්වල බැර ශේෂ පහත පරිදි විය:

| | **ප්‍රාග්ධන ගිණුම් (රු.'000)** | **ජංගම ගිණුම් (රු.'000)** |
|---|---|---|
| අමල් | 4 200 | 800 |
| කමල් | 3 000 | 500 |
| නිමල් | 2 000 | 300 |

[තුන්වැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

(1) වැරදි නිවැරදි කිරීමට ජර්නල් සටහන් (සංලක්ෂ්‍ය සමග)

(2) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ නිවැරදි ලාභය දක්වන ප්‍රකාශනයක්

(3) 2017.03.31 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම්

**(ලකුණු 10 යි)**

(ආ) උළු නිෂ්පාදන ආයතනයක කර්මාන්තශාලාවෙහි යන්ත්‍ර සහ නිමැවුම් යන නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙකක් ඇත. තව ද එහි සේවා පිරිවැය මධ්‍යස්ථානයක් වන ගබඩාව ද ඇති අතර එය කර්මාන්තශාලාව පිහිටි ගොඩනැගිල්ලෙහි ම පිහිටා ඇත. 'A' සහ 'B' ලෙස උළු වර්ග දෙකක් මෙම ආයතනය නිපදවනු ලබයි. පහත අයවැයගත පිරිවැය තොරතුරු සපයා ඇත.

| | රු.'000 |
|---|---|
| **වැටුප්:** | |
| කර්මාන්තශාලා සුපරීක්ෂකවරුන් | 240 |
| ගබඩා සේවකයින් | 150 |
| පරිපාලන නිලධාරීන් | 400 |
| **කුලිය:** | |
| ගබඩාව ද සහිත කර්මාන්තශාලා ගොඩනැගිල්ල | 680 |
| පරිපාලන ගොඩනැගිල්ල | 320 |
| **ක්ෂය :** | |
| යන්ත්‍ර | 100 |
| **විදුලිය:** | |
| ගබඩාව ද සහිත කර්මාන්තශාලා ගොඩනැගිල්ල | 400 |
| පරිපාලන ගොඩනැගිල්ල | 120 |
| **රක්ෂණය:** | |
| යන්ත්‍ර | 80 |
| **අලුත්වැඩියා:** | |
| යන්ත්‍ර | 200 |
| **නඩත්තු :** | |
| ගබඩාව ද සහිත කර්මාන්තශාලා ගොඩනැගිල්ල | 340 |
| පරිපාලන ගොඩනැගිල්ල | 150 |

පහත තොරතුරු ද සපයා ඇත.

| විස්තරය | යන්ත්‍ර | නිමැවුම් | ගබඩා |
|---|---|---|---|
| යන්ත්‍ර පිරිවැය (රු.) | 750 000 | 250 000 | – |
| සේවක සංඛ්‍යාව | 25 | 75 | – |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර) | 15 000 | 15 000 | 4 000 |
| විදුලිය (කිලෝවොට් පැය) | 12 000 | 7 000 | 1 000 |
| යන්ත්‍ර පැය | 20 000 | 6 000 | – |
| සෘජු ශ්‍රම පැය | 2 000 | 10 000 | – |

- ගබඩාවේ පොදු කාර්ය පිරිවැය, යන්ත්‍ර සහ නිමැවුම් මධ්‍යස්ථාන දෙක අතර සමානව නැවත විභජනය කරනු ලැබේ.
- යන්ත්‍ර මධ්‍යස්ථානය යන්ත්‍ර පැය මත ද, නිමැවුම් මධ්‍යස්ථානය ශ්‍රම පැය මත ද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.
- 'A' වර්ගයේ උළු කැටයක් නිපදවීම සඳහා යන්ත්‍ර සහ නිමැවුම් මධ්‍යස්ථානවල පිළිවෙළින් යන්ත්‍ර පැය 4 ක් සහ ශ්‍රම පැය 2 ක් ගත කරයි.
- 'A' වර්ගයේ උළු කැටයක් නිපදවීම සඳහා සෘජු අමුද්‍රව්‍ය සහ සෘජු ශ්‍රම පිරිවැය පිළිවෙළින් රු. 162 ක් සහ රු. 100 ක් වේ යැයි ඇස්තමේන්තු කර ඇත.

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම දක්වමින් නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) යන්ත්‍ර සහ නිමැවුම් මධ්‍යස්ථාන සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) 'A' වර්ගයේ උළු කැටයක නිෂ්පාදන පිරිවැය

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 20 යි)**

/හතරවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**3.** 2017 ජනවාරි මාසය තුළ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනුවල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණ තුළින් නිරූපණය වේ. මෙම මාසය තුළ අයිතිකරු කිසිදු මුදලක් ව්‍යාපාරයෙන් ලබාගෙන නොමැත.

(රු.'000)

| ශේෂ සහ ගනුදෙනු | වත්කම් | | | = | වගකීම් + | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | බැංකුවේ මුදල් | බැංකු ණය | වෙළෙඳ ගෙවිය යුතු දෑ | ප්‍රාග්ධනය | රඳවාගත් ඉපැයුම් |
| 2017.01.01 දිනට ශේෂ | 2 000 | 1 300 | 500 | 200 | 1 000 | 800 | 1 000 | 1 200 |
| 1 | + 1 000 | | | | + 1 000 | | | |
| 2 | | + 250 | | | | + 250 | | |
| 3 | | | | + 600 | | | + 600 | |
| 4 | | | | – 400 | | | | – 400 |
| 5 | | – 1 000 | + 1 800 | | | | | + 800 |
| 6 | | | – 500 | | | – 500 | | |
| 7 | – 50 | | | | | | | – 50 |
| 8 | | | – 150 | | | | | – 150 |
| 9 | | | | –180 | –150 | | | – 30 |
| 10 | | + 200 | – 250 | | | | | – 50 |
| **2017.01.31 දිනට ශේෂ** | **2 950** | **750** | **1 400** | **220** | **1 850** | **550** | **1 600** | **1 320** |

**අවශ්‍යවන්නේ:**

(1) ඉහත 1 සිට 10 දක්වා ඇති එක් එක් ගනුදෙනු වටිනාකම් සහිත ව විස්තර කිරීම

(2) 2017.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය හෝ අලාභය

(3) වත්කම් සහ වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ග කරමින් 2017.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 15 යි)**

**4.** (අ) 2017 ජූලි මාසය සඳහා සමාගමක වේතනවලට අදාළ තොරතුරු පහත පරිදි වේ.

- මාසයේ දළ වේතනය රු. 680 000 ක් වූ අතර එය පහත දෑ වලින් සමන්විත විය:
  - (i) වැඩ කළ සාමාන්‍ය පැය 4 800 ක් සඳහා පැයකට රු. 100 බැගින් මූලික වේතන
  - (ii) පැයක රේටය රු. 150 බැගින් වැඩ කළ පැය 500 ක් සඳහා අතිකාල දීමනා
  - (iii) ලාභය මත පදනම්ව රු. 100 000 ක ප්‍රසාද දීමනාව
  - (iv) යන්ත්‍රයක් ස්ථාපනය කිරීමට බාහිර පාර්ශ්වයකට ගෙවූ ශ්‍රම ගාස්තුව රු. 25 000

- මාසය සඳහා වේතනවලින් කළ අඩු කිරීම් පහත පරිදි වේ.
  - (i) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකය රු. 48 000
  - (ii) සේවක ණය මත වාරිකය රු. 120 000
  - (iii) සේවක සුබසාධක අරමුදල සඳහා දායකය රු. 25 000

- සේවක අර්ථසාධක අරමුදලට සේව්‍ය සහ සේවක දායකත්ව පිළිවෙළින් 15% ක් සහ 10% ක් වේ. මෙම සමාගම මූලික වේතනය මත පදනම්ව EPF දායකයන් ගණනය කරයි.

**අවශ්‍යවන්නේ:**

2017 ජූලි මාසය සඳහා පහත ගිණුම්:

(1) වේතන

(2) වේතන පාලන

(3) EPF වියදම්

(4) ගෙවිය යුතු EPF

**(ලකුණු 05 යි)**

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයක ප්‍රථම මෙහෙයුම් මාසය තුළ භාණ්ඩ ගැනුම් සහ විකුණුම්වලට අදාළව පහත ගනුදෙනු සිදු විය.

| දිනය | විස්තරය | වටිනාකම (රු.'000) |
|---|---|---|
| 2017.01.02 | අත්පිට ගැනුම් | 200 |
| 2017.01.08 | අත්පිට විකුණුම් | 300 |
| 2017.01.10 | නාමල්ගෙන් ණයට ගැනුම් | 500 |
| 2017.01.12 | නාමල්ගෙන් මිලට ගත් භාණ්ඩ ආපසු යැවුම් | 100 |
| 2017.01.15 | අත්පිට ගැනුම් | 400 |
| 2017.01.16 | ඩේවිඩ්ට ණයට විකුණුම් | 500 |
| 2017.01.18 | රු. 20 000 ක වට්ටමක් ලැබීමෙන් පසු නාමල්ට මුදල් ගෙවීම | 180 |
| 2017.01.20 | අනුරගෙන් ණයට ගැනුම් | 300 |
| 2017.01.22 | නායගම්ට ණයට විකුණුම් | 400 |
| 2017.01.24 | නායගම් භාණ්ඩ ආපසු එවීම | 150 |
| 2017.01.25 | ඩේවිඩ්ගෙන් මුදල් ලැබීම | 400 |
| 2017.01.26 | රු. 10 000 ක වට්ටමක් ලැබීමෙන් පසු අනුරට මුදල් ගෙවීම | 290 |
| 2017.01.30 | රු. 20 000 ක වට්ටමක් ලබා දීමෙන් පසුව නායගම්ගෙන් මුදල් ලැබීම | 230 |

- 2017.01.31 දිනට තොගයේ පිරිවැය රු. 300 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

2017 ජනවාරි මාසය සඳහා පහත සඳහන් දෑ:

(1) මුදල් ලැබීම් ජර්නලයේ සහ මුදල් ගෙවීම් ජර්නලයේ උද්ධෘත

(2) පොදු ලෙජරයේ පහත ගිණුම්:

(i) ගැනුම්

(ii) විකුණුම්

(iii) ණයහිමි පාලන

(iv) ණයගැති පාලන

(3) දළ ලාභය ගණනය කිරීම

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

5. (අ) පහත තොරතුරු සීමිත මංගල පොදු සමාගමට අදාළ වේ.

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:

| විස්තරය | රු.'000 |
|---|---|
| විකුණුම් | 6 300 |
| වර්ෂයේ බදු පසු ලාභය | 1 200 |
| පොලී වියදම | 300 |
| වර්ෂය සඳහා බදු | 600 |

2017.03.31 දිනට:

| මුළු වත්කම්: | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 3 000 |
| තොග | 500 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 800 |
| මුදල් | 200 |
| **මුළු වගකීම්:** | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 500 |
| බැංකු ණය (වසර 3 කට පසුව ගෙවිය යුතු) | 1 000 |

**අතිරේක තොරතුරු:**

(i) 2016.03.31 දිනට වෙළෙඳ ලැබිය යුතු දෑ රු. 600 000 ක් විය.

(ii) සියලු ම විකුණුම් ණය පදනම මත සිදු විය.

[හයවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**අවශ්‍යවන්නේ:**

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා:

(1) ජංගම අනුපාතය
(2) ණයගැති පිරිවැටුම් අනුපාතය (සාමාන්‍ය ණයගැතියෝ මත පදනම්ව)
(3) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය
(4) පොලී ආවරණ අනුපාතය
(5) වත්කම් පිරිවැටුම් අනුපාතය (වසර අග වත්කම් මත පදනම්ව)

**(ලකුණු 05 යි)**

(ආ) අවට ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් උදාර ක්‍රීඩා සමාජය පිහිටුවන ලදී. එය සතුව පිහිනුම් තටාකයක් සහ ක්‍රීඩාගාරයක් ඇත.

සාමාජිකයකුගේ වාර්ෂික සාමාජික මුදල රු. 10 000 ක් වන අතර එය ක්‍රීඩා සමාජයට බැඳෙන විට දී ගෙවිය යුතු වේ. කෙසේ වුව ද සාමාජික මුදල්, ආදායම තුළ හඳුනාගනු ලබනුයේ වර්ෂය තුළ සාමාජිකත්වය දැරූ මාස ගණන පදනම්ව ය. 2017.03.31 දින සාමාජිකයින් 105 දෙනකු වූ අතර එහි සංයුතිය පහත පරිදි වේ:

| **විස්තරය** | **සාමාජික සංඛ්‍යාව** |
|---|---|
| 2016.04.01 දිනට සාමාජිකයින් .............................. | 60 |
| වර්ෂය තුළ දී අලුතින් බැඳුණු සාමාජිකයින්: | |
| 2016.07.01 දින .............................................. | 30 |
| 2016.10.01 දින .............................................. | 15 |

2016.04.01 දිනට කලින් ලද සාමාජික මුදල් නොවූ අතර 2017.03.31 දිනට හිඟ සාමාජික මුදල් ද නොවී ය.

ක්‍රීඩා සමාජයේ පහසුකම් මාසික පදනම මත මුදලට සාමාජිකයින් නොවන අයට ද විවෘත වන අතර ප්‍රවර්තන වර්ෂය තුළ දී ඔවුන්ගේ පහසුකම් භාවිතය පහත පරිදි විය:

| **භාවිත කළ පහසුකම්** | **පුද්ගලයකුට මාසික ගාස්තුව** | **භාවිත කළ පුද්ගලයින් ගණන** | **භාවිත කළ මාස ගණන** |
|---|---|---|---|
| පිහිනුම් තටාකය සහ ක්‍රීඩාගාරය යන දෙක ම | රු. 1 000 | 30 | 6 |
| | | 20 | 8 |
| පිහිනුම් තටාකය හෝ ක්‍රීඩාගාරය | රු. 500 | 60 | 10 |

තව ද, ක්‍රීඩා සමාජය විසින් දිනකට රු. 150 000 ක ගාස්තුවක් අයකරමින් බාහිර පාර්ශ්වවලට ක්‍රීඩා උත්සව පැවැත්වීමට පිහිනුම් තටාකය කුලියට දෙනු ලැබේ. මෙම ගාස්තුවෙන් 80% ක් තටාකය වෙන්කරනු ලබන විට දී ද, ඉතිරිය උත්සව දිනයේ දී ද ගෙවිය යුතු ය. වර්ෂය තුළ දී ක්‍රීඩා උත්සව දෙකක් පවත්වන ලද අතර ඉන් පළමුවැන්න දින 3 ක් සඳහා ද, දෙවැන්න දින 2 ක් සඳහා ද විය. තව ද, 2017.04.08 දින පැවැත්වීමට නියමිත ක්‍රීඩා උත්සවයක් සඳහා 2017.03.20 දින පිහිනුම් තටාකය වෙන්කර ගන්නා ලදී.

වර්ෂය තුළ දැරූ මුළු වියදම රු. 1 370 000 ක් විය. එය මුදලින් ගෙවා ඇත.

ක්‍රීඩා සමාජයේ වත්කම්වල ධාරණ වටිනාකම:

| **වත්කම්** | **2017.03.31 දිනට (රු.'000)** | **2016.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 8 500 | 9 250 |
| 12% ස්ථාවර තැන්පතුව | 1 500 | – |
| මුදල් | ? | 400 |

2016.03.31 දිනට වගකීම් කිසිවක් නොවී ය. වර්ෂය තුළ දී දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම් හෝ ඉවත් කිරීම් කිසිවක් ද නොවී ය.

ස්ථාවර තැන්පතුව වර්ෂයක කාලයක් සඳහා 2016.07.01 දින ආරම්භ කරන ලද අතර එහි පොලිය කල් පිරෙන අවස්ථාවේ දී ලැබෙනු ඇත.

**අවශ්‍යවන්නේ:**

ක්‍රීඩා සමාජය සඳහා පහත දෑ:

(1) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම
(2) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය
(3) 2017.03.31 දිනට වගකීම් (අයිතම වෙන වෙන ම දක්වන්න.)

**(ලකුණු 10 යි)**
**(මුළු ලකුණු 15 යි)**

[හත්වැනි පිටුව බලන්න.

6. (අ) පිරිවැය රු. 1 200 000 ක් වන නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට සමාගමක් සලකා බලමින් සිටී. යන්ත්‍රයෙහි අපේක්ෂිත ඵලදායී ජීව කාලය වර්ෂ 5 ක් වන අතර එහි සුන්බුන් අගය රු. 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම යන්ත්‍රය භාණ්ඩයක් නිෂ්පාදනය කිරීම සඳහා භාවිත කරනු ලබන අතර එහි අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පහත පරිදි වේ.

| **වර්ෂය** | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **නිෂ්පාදනය (ඒකක)** | 500 | 500 | 500 | 600 | 600 |

ඒකකයක අපේක්ෂිත විකුණුම් මිල රු. 2 000 ක් වේ. ඒකකයක අපේක්ෂිත ප්‍රාථමික පිරිවැය රු. 1 000 ක් වන අතර වාර්ෂික නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (ක්ෂය ද ඇතුළුව) රු. 300 000 ක් වනු ඇත. ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වේ.

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියේ මුදල් ගලාඒම්, මුදල් ගලායාම් සහ ශුද්ධ වර්තමාන අගය (පිළිතුරු සැපයීමේ දී පහත ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

| වසර | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| මුදල් ගලාඒම්: | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| මුදල් ගලායාම්: | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | | | | | | |
| 10% වට්ටම් සාධකය (දශමස්ථාන දෙකකට) | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |
| ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි වර්තමාන අගය | | | | | | |
| ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය | | | | | | |

(2) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව ව්‍යාපෘතිය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ නිර්දේශය

**( ලකුණු 05 යි)**

(ආ) පහත තොරතුරු සීමිත රවිඳු පොදු සමාගමට අදාළ වේ.

- 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ උද්ධෘතයක්:

| | **රු.'000** |
|---|---|
| දළ ලාභය | 5 600 |
| දේපළ, පිරියත සහ උපකරණ විකුණුම් මත ලාභ | 700 |
| මෙහෙයුම් වියදම් | (800) |
| ක්ෂය | (1 200) |
| මූල්‍ය වියදම් | (1 300) |
| බදු පෙර ලාභය | 3 000 |
| ආදායම් බදු | (1 800) |
| වර්ෂයේ ලාභය | 1 200 |

- සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශන:

| **විස්තරය** | **2017.03.31 දිනට (රු.'000)** | **2016.03.31 දිනට (රු.'000)** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපළ, පිරියත සහ උපකරණ – පිරිවැයට | 37 000 | 30 000 |
| සමුච්චිත ක්ෂය | (12 000) | (14 900) |
| | 25 000 | 15 100 |
| **ජංගම වත්කම්** | | |
| තොග | 2 000 | 3 000 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 9 000 | 8 000 |
| මුදල් හා මුදල් සමාන දෑ | 2 000 | 1 900 |
| **මුළු වත්කම්** | 38 000 | 28 000 |

/අටවැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

| | | |
|---|---|---|
| **හිමිකම** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | 18 000 | 10 000 |
| රඳවාගත් ඉපැයුම් | 2 100 | 1 800 |
| **ජංගම නොවන වගකීම්** | | |
| බැංකු ණය | 7 000 | 8 000 |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 6 000 | 4 000 |
| ගෙවිය යුතු මූල්‍ය වියදම් | 4 000 | 3 000 |
| ගෙවිය යුතු ආදායම් බදු | 900 | 1 200 |
| **මුළු හිමිකම සහ වගකීම්** | 38 000 | 28 000 |

**අතිරේක තොරතුරු:**

(i) රු. 9 000 000 කට මිල දී ගත් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් 2017.03.31 දින අත්පිට මුදලට විකුණන ලදී. මෙදිනට මෙම වත්කමෙහි සමුච්චිත ක්ෂය රු. 4 100 000 ක් විය.

(ii) ලාභාංශ ලෙස රු. 900 000 ක් වර්ෂය තුළ දී ගෙවා ඇත.

(iii) වර්ෂය තුළ කොටස් නිකුතුවෙන් ලද මුදල රු. 8 000 000 ක් විය.

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත රවිඳු පොදු සමාගමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

7. (අ) එළවළු ඇසුරුම් කිරීමේ පෙට්ටි නිපදවන සමාගමක් ඒ සඳහා විශේෂ වර්ගයක අමුද්‍රව්‍යයක් භාවිත කරයි. එක් ඇසුරුම් පෙට්ටියක් නිපදවීමට මෙම අමුද්‍රව්‍ය කිලෝග්‍රෑම් 4 ක් අවශ්‍ය වේ. මාසික නිෂ්පාදනය ඇසුරුම් පෙට්ටි 150 සිට 200 දක්වා විචලනය වේ. මෙම අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 4 000 ක් වන අතර ඇණවුමක පොරොත්තු කාලය වැඩ කරන දින 5 සිට 7 දක්වා විචලනය වේ.

**අවශ්‍යවන්නේ:**

මෙම අමුද්‍රව්‍යයට අදාළව:

(1) යළි ඇණවුම් මට්ටම

(2) අවම තොග මට්ටම

(3) උපරිම තොග මට්ටම

(4) සාමාන්‍ය තොග මට්ටම

**(ලකුණු 05 යි)**

(ආ) විශේෂිත අවශ්‍යතා සහිත පාසල් ළමුන්ගේ භාවිතය සඳහා ආනයනික උපාංග එකලස් කිරීමෙන් පරිගණක නිෂ්පාදනය කිරීමට සමාගමක් සැලසුම් කරමින් සිටී. පරිගණකයක විකුණුම් මිල රු. 50 000 ක් ලෙස තීරණය කර ඇති අතර අපේක්ෂිත පිරිවැය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| බලපත්‍ර ගාස්තුව | මසකට | රු. 50 000 |
| **වැටුප්:** | | |
| සුපරීක්ෂකවරුන් | මසකට | රු. 80 000 |
| එකලස් සේවකයින් | ඒකකයකට | රු. 8 000 |
| කුලිය | වසරකට | රු. 360 000 |
| රක්ෂණය | මසකට | රු. 40 000 |
| ද්‍රව්‍ය පිරිවැය | ඒකකයකට | රු. 12 000 |
| උපදේශකයන් දෙදෙනකු සඳහා ගාස්තුව | මසකට | රු. 100 000 |

**අවශ්‍යවන්නේ:**

(1) මාසික මුළු ස්ථාවර පිරිවැය (අයිතමයන් වෙන වෙන ම දක්වන්න.)

(2) මුළු පිරිවැය ආවරණය කර ගැනීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන

(3) රු. 150 000 ක ලාභයක් ඉපැයීම සඳහා මාසිකව විකිණිය යුතු පරිගණක ගණන

(4) ඒකක මත වැටුප වෙනුවට එකලස් සේවකයින්ට රු. 80 000 ක මුළු මාසික වැටුපක් ගෙවන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන

(5) එකලස් අංශය ස්වයංක්‍රීය කිරීම තුළින් එකලස් සේවකයකුට ඒකකයකට ගෙවන වැටුප රු. 3 000 දක්වා අඩු කිරීමට හැකි වන්නේ නම්, මුළු පිරිවැය ආවරණය කිරීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන. මෙම ස්වයංක්‍රීය කිරීම නිසා වාර්ෂික ස්ථාවර පිරිවැය රු. 180 000 කින් වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**(ලකුණු 10 යි)**

**(මුළු ලකුණු 15 යි)**

* * *

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**ප්‍රශ්න අංක 01**

(1)

සීමිත ඩිලාර පොදු සමාගම

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (01)

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | සටහන් | රු' 000 | |
|---|---|---|---|
| විකුණුම් | | 38 000 | (01) |
| විකුණුම් පිරිවැය | | (18 700) | (02) |
| දළ ලාභය | (01) | 19 300 | |
| බෙදාහැරීමේ පිරිවැය | | (7 080) | (03) |
| පරිපාලන වියදම් | | (8 200) | (02) |
| වෙනත් වියදම් | | 900 | (02) |
| මූල්‍ය පිරිවැය | | (800) | (02) |
| බදු පෙර ලාභය | 1 | 4 120 | |
| ආදායම් බදු | 2 | (1 600) | (02) |
| කාලච්ඡේදයේ ලාභය | (01) | 2 520 | |
| **වෙනත් විස්තීරණ ආදායම්** | | | |
| ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම | | 800 | (01) |
| මුළු විස්තීරණ ආදායම | (01) | 3 320 | |

**සටහන් 01 :** බදුපෙර ලාභය ගණනය කර ඇත්තේ පහත වියදම් ද අඩු කිරීමෙන් පසුවය.

| | රු' 000 |
|---|---|
| තොග කපාහැරීම | 300 |
| ක්ෂය | 3 600 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | 1 800 |
| විගණන ගාස්තු | 600 |
| පොළී (කල්බදු පොළී + බැංකු ණය පොළී) | 800 |

**(ඕනෑම අයිතම දෙකකට 01 බැගින් ලකුණු 02 යි)**

**සටහන් 02 :** ආදායම් බදු

| | රු' 000 | |
|---|---|---|
| ප්‍රවර්ථන වර්ෂය සඳහා වෙන් කිරීම | 1 500 | 01 |
| පසුගිය වර්ෂය සඳහා ඌණ වෙන් කිරීම | 100 | 01 |
| | 1 600 | |

~~(ලකුණු 21)~~

**පෙර වැඩ** රු' 000

**විකුණුම් පිරිවැය**

| | | |
|---|---|---|
| 2016.04.01 තොගය | 3 000 | |
| නිෂ්පාදිත භාණ්ඩ | 12 000 | 01 |
| මිලදී ගැනුම් | 6 000 | |
| 2017.03.31 තොගය | (2 300) | 01 |
| | 18 700 | |

**පරිපාලන වියදම්**

| | | |
|---|---|---|
| පරිපාලන වියදම් | 8 400 | |
| විගණන ගාස්තු | 200 | 01 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමික | (400) | 01 |
| | 8 200 | |

**බෙදාහැරීමේ පිරිවැය**

| | | |
|---|---|---|
| බෙදාහැරීමේ පිරිවැය | 8 000 | |
| ලොරි රථ ක්ෂය | 500 | 01 |
| වෑන් රථ ක්ෂය අඩුවීම | (100) | 01 |
| කල්බදු වාරිකය ඉවත් කිරීම | (1 320) | 01 |
| | 7 080 | |

**මූල්‍ය පිරිවැය**

| | | |
|---|---|---|
| කල්බදු පොළී | 500 | 01 |
| බැංකු ණය පොළී | 300 | 01 |
| | 800 | |

**වෙනත් වියදම්**

| | | |
|---|---|---|
| තොග කපා හැරීම | 300 | 01 |
| ඉඩම් ප්‍රත්‍යාගණන ඌණතාවය හිලව් කිරීම | (1 200) | 01 |
| | 900 | |

(2) සීමිත ඩිලාර පොදු සමාගම

2017.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| | සටහන් | රු' 000 | රු' 000 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 3 | (01) | 34 100 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 4 | 4 000 (01) | |
| වෙනත් ජංගම වත්කම් | 5 | 400 (01) | |
| මුදල් හා මුදල් සමාන දෑ | | 6 000 | 10 400 |
| මුළු වත්කම් | | | 44 500 |
| **ප්‍රකාශිත ප්‍රාග්ධනය** | | | |
| සාමාන්‍ය කොටස් | | | 20 000 |
| **සංචිත** | | (01) | |
| ප්‍රත්‍යාගණන සංචිතය | | 800 | |
| රඳවාගත් ඉපැයුම් | | 6 220 | 7 020 |
| මුළු හිමිකම | | | 27 020 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ~~බැංකු ණය~~ | | 12 000 | |
| කල්බදු ණයහිමියෝ | | 3 278 (01) | 15 278 |
| **ජංගම වගකීම්** | | | |
| කල්බදු ණයහිමියෝ | | 902 (01) | |
| ගෙවිය යුතු ආදායම් බදු | | 500 (01) | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 6 | 800 (03) | 2 202 |
| මුළු වගකීම් සහ හිමිකම | | | 44 500 |

**සටහන 03 - දේපළ, පිරියත සහ උපකරණ** (රු' 000)

| | ඉඩම | පිරියත සහ යන්ත්‍ර | මෝටර් රථ | ලී බඩු සහ සවිකිරීම් | එකතුව |
|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | |
| 2016.04.01 දිනට ශේෂය | 10 000 | 21 000 | 4 000 | 7 000 | 42 000 |
| ප්‍රත්‍යාගණනය | 2 000 (01) | | | | 2 000 |
| එකතු කිරීම් | | | 5 000 (01) | | 5 000 |
| 2017.03.31 දිනට ශේෂය | 12 000 | 21 000 | 9 000 | 7 000 | 49 000 |
| **සමුච්චිත ක්ෂය** | | | | | |
| 2016.04.01 දිනට ශේෂය | (01) | 7 600 | 1 600 | 2 100 | 11 800 |
| කාලච්ඡේදයේ ක්ෂය | | 2 100 | 800 | 700 | 3 600 |
| | | | (02) | | |
| 2017.03.31 දිනට ශේෂය | - | 9 700 | 2 400 | 2 800 | 14 900 |
| 2017.03.31 දිනට ධාරණ වටිනාකම | 12 000 | 11 300 | 6 600 | 4 200 | 34 100 |

(ලකුණු 16)

**සටහන 04 -** **තොග** රු' 000

| | |
|---|---|
| අමුද්‍රව්‍ය | 2 000 |
| නිමි භාණ්ඩ | 2 000 |
| | 4 000 |

**සටහන 05 -** **වෙනත් ජංගම වත්කම්** රු' 000

ඉදිරියට ගෙවූ අධ්‍යක්ෂ පාරිශ්‍රමික රු. 5 400

**සටහන 06** **වෙනත් ගෙවිය යුතු දෑ** රු' 000

| | |
|---|---|
| විගණන ගාස්තු | 200 01 |
| ණය පොලී | 100 01 |
| VAT | 500 01 |
| | 800 |

(3)

සීමිත ඩිලාර පොදු සමාගම

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය (රු' 000)

| විස්තරය | ප්‍රකාශිත ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් | ප්‍රත්‍යාගණන සංචිතය | රඳවාගත් ඉපැයුම් | එකතුව |
|---|---|---|---|---|
| 2016.04.01 දිනට ශේෂ | 15 000 | | 5 400 | 20 400 |
| කොටස් නිකුත් කිරීම | 5 000 (01) | | | 5 000 |
| මුළු විස්තීරණ ආදායම | | (01) 800 | 2 520 | 3 320 |
| අතුරු ලාභාංශ | | | (1 700) | (01) (1 700) |
| 2017.03.31 දිනට ශේෂය | 20 000 | 800 | 6 220 | 27 020 |

*(ලකුණු 03)*

| | | 2 | 3 | එකතුව |
|---|---|---|---|---|
| **ප්‍රශ්න අංක 1** | 21 | 16 | 03 | 40 |

ප්‍රශ්න අංක 02

(02) (අ)

(1)

පොදු ජර්නලය

රු.' 000

| විස්තරය | හර | බැර | |
|---|---|---|---|
| (i). අවිනිශ්චිත ගිණුම<br>ලාභාලාභ ගිණුම (වැටුප්)<br>(සේවක වැටුප් එම ගිණුමට වැඩියෙන් හර කිරීමේ වරද නිවැරදි කිරීම.) | 270 | 270 | (02) |
| (ii). ලාභාලාභ ගිණුම (පොළී ආදායම)<br>ලාභාලාභ ගිණුම (පොළී වියදම)<br>අවිනිශ්චිත ගිණුම<br>(බැංකු ණය පොළී, පොළී ආදායම් ගිණුමට බැර කිරීමේ වරද නිවැරදි කිරීම) | 10<br>100 | 110 | (02) |
| (iii). කාර්යාල උපකරණ ගිණුම<br>ලාභාලාභ ගිණුම (කාර්යාල වියදම්)<br>(කාර්යාල උපකරණ මිලට ගැනුම් කාර්යාල වියදම් ලෙස සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම) | 300 | 300 | (02) |
| (iv). ලාභාලාභ ගිණුම (කාර්යාල උපකරණ ක්ෂය)<br>කාර්යාල උපකරණ සමුච්චිත ක්ෂය ගිණුම<br>(සටහන් නොවූ කාර්යාල උපකරණ සඳහා ක්ෂය ගැලපීම) | 30 | 30 | (02) |
| (v). ජංගම ගිණුම - අමල්<br>ලාභාලාභ ගිණුම (රක්ෂණ වියදම්)<br>(අමල්ගේ පෞද්ගලික රක්ෂණ වාරිකය, රක්ෂණ ගාස්තු ගිණුමේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම) | 150 | 150 | (02) |

(සංලක්ෂ්‍යය ලියා නැත්නම් ලද මුළු ලකුණු වලින් ලකුණු 02 ක් අඩු කරන්න.)
(ලකුණු 10)

(2) ලාභය නිවැරදි කිරීමේ ප්‍රකාශනය

රු.' 000

| | | |
|---|---|---|
| කෙටුම්පත් ලාභය | | 3 400 |
| **එකතුකිරීම්** | | |
| වැටුප් | 270 * | |
| කාර්යාල වියදම් | 300 * | |
| රක්ෂණ ගාස්තු | 150 * | 720 |
| | | 4 120 |
| **අඩුකිරීම්** | | |
| පොළී ආදායම | 10 * | |
| බැංකු ණය පොළිය | 100 * | |
| කාර්යාල උපකරණ ක්ෂය | 30 * | (140) |
| නිවැරදි ලාභය | | 3 980 |

(* අයිතම දෙකකට එක බැගින් ලකුණු 3 යි)

**(3)**

ප්‍රාග්ධන ගිණුම් රු' 000

| | අමල් | කමල් | නිමල් | | අමල් | කමල් | නිමල් |
|---|---|---|---|---|---|---|---|
| කීර්තිනාමය | | 1 200 | 600 (01) | ශේෂය ඉ/ගෙ | 4 200 | 3 000 | 2 000 |
| ණය ගිණුම - අමල් | (01) 7 700 | | | කීර්තිනාමය | 900 | 600 | 300 (01) |
| ශේෂය ප/ගෙ | | 2 400 | 1 700 | ජංගම ගිණුම- අමල් | 2 600 | | |
| | 7 700 | 3 600 | 2 300 | | 7 700 | 3 600 | 2 300 |

ජංගම ගිණුම් රු' 000

| | අමල් | කමල් | නිමල් | | අමල් | කමල් | නිමල් |
|---|---|---|---|---|---|---|---|
| ගැනිලි | 150 (01) | | | ශේෂය ඉ/ගෙ | 800 | 500 | 300 |
| ප්‍රාග්ධන ගිණුම - අමල් | (01) 2 600 | | | ප්‍රාග්ධන පොළී | 420 | 300 | 200 (01) |
| ශේෂය ප/ගෙ | | 1 820 | 1 010 | ලාභ කොටස් | (01) 1 530 | 1 020 | 510 |
| | 7 700 | 3 600 | 1 010 | | 2 750 | 1 820 | 1 010 |

(ලකුණු 07)
(ලකුණු 20)

PADANAMA PUBLICATION

(ආ) (1)

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව රු.' 000

| අයිතමය | විභජන පදනම | එකතුව | නිෂ්පාදන දෙපාර්තමේන්තු | | නිෂ්පාදන දෙපාර්තමේන්තු |
|---|---|---|---|---|---|
| | | | යන්ත්‍ර | නිමැවුම් | ගබඩාව |
| ගබඩා සේවක වැටුප් | සෘජු | 150 | | | 150 |
| සුපරීක්ෂක වැටුප් | සේවක සංඛ්‍යාව/1:3 (01) | 240 | 60 | 180 (01) | |
| ගොඩනැගිලි කුලී | භූමි ප්‍රමාණය/15:15:4 (01) | 680 | 300 | 300 | 80 (01) |
| යන්ත්‍ර ක්ෂය | යන්ත්‍ර පිරිවැය/3:1 (01) | 100 | 75 | 25 (01) | |
| විදුලි ගාස්තු | කි.වො.පැය/12:7:1 (01) | 400 | 240 | 140 | 20 (01) |
| යන්ත්‍ර රක්ෂණය | යන්ත්‍ර පිරිවැය/3:1 (01) | 80 | 60 | 20 (01) | |
| යන්ත්‍ර අළුත්වැඩියා | යන්ත්‍ර පිරිවැය/3:1 (01) | 200 | 150 | 50 (01) | |
| නඩත්තු | භූමි ප්‍රමාණය/15:15:4 (01) | 340 | 150 | 150 | 40 (01) |
| ගබඩා පොදු කාර්ය පිරිවැය | | 2 190 | 1 035 | 865 | 290 |
| නැවත විභජනය | | | (01) 145 | 145 | (290) |
| | | 2 190 | 1 180 | 1 010 | |

(ලකුණු 15)

(2) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය

යන්ත්‍ර දෙපාර්තමේන්තුව - යන්ත්‍ර පැයකට රු. 59 (01)

නිමැවුම් දෙපාර්තමේන්තුව - ශ්‍රම පැයකට රු. 101 (01)

(ලකුණු 02)

**පෙරවැඩ**

යන්ත්‍ර දෙපාර්තමේන්තුව $\frac{1\ 180\ 000}{20\ 000}$ [01] = රු. 59

නිමැවුම් දෙපාර්තමේන්තුව $\frac{1\ 010\ 000}{10\ 000}$ [01] = රු. 101

(3) A වර්ගයේ උළු කැටයක නිෂ්පාදන පිරිවැය රු. 700 (03)

**පෙරවැඩ** රු.

සෘජු අමුද්‍රව්‍ය 162 [01]

සෘජු ශ්‍රමය 100

නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය - යන්ත්‍ර 59 X 4 = [01] 236

- නිමැවුම් 101 X 2 = [01] 202

700

(ලකුණු 03)

ප්‍රශ්න අංක 2

| | 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|---|
| අ | 10 | 03 | 07 | 20 |
| ආ | 15 | 02 | 03 | 20 |
| | | | | 40 |

**ප්‍රශ්න අංක 03**

**(3) (1)**

(1). බැංකු ණයක් මගින් රු.1 000 000 ක දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම.

(2). රු.250 000 ක භාණ්ඩ ණයට ගැනීම.

(3). රු.600 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස යෙදවීම

(4). රු.400 000 ක වියදම් ගෙවීම

(5). රු.1 000 000 ක භාණ්ඩ තොග රු.1 800 000 කට ණයට විකිණීම.

(6). රු.500 000 ක ණයගැති හර ශේෂයක් ණයහිමි බැර ශේෂයකට හිළවි කිරීම.

(7). දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය රු.50 000 ක් සටහන් කිරීම.

(8). රු.150 000 ක් බොල් ණය ලෙස කපා හැරීම.

(9). පොළිය රු.30 000 ක් සහිතව රු.180 000 ක බැංකු ණය වාරිකයක් ගෙවීම.

(10). රු.200 000 ක් පිරිවැය වූ රු.250 000 කට ණයට විකුණු භාණ්ඩ ආපසු එවීම.

**(එකකට දෙක බැගින් ලකුණු 20)**

(2) ලාභය රු. 120 000 (03)

**(ලකුණු 03)**

**පෙරවැඩි**

(1) අවසාන රඳවාගත් ඉපැයුම් - ආරම්භක රඳවාගත් ඉපැයුම්

1 320 000 [02] - 1 200 000 [01]

= රු.120 000

| | | රු. |
|---|---|---|
| (2) | භාණ්ඩ විකුණුම් ලාභය | 800 000 |
| | වියදම් | (400 000) |
| | ක්ෂය | (50 000) |
| | බොල් ණය | (150 000) |
| | ණය පොළී | (30 000) |
| | ~~ප්‍රත් එවීම්~~ | (50 000) |
| | ලාභය | 120 000 |

**නිවැරදි අගයන් දෙකකට එක බැගින් ලකුණු** [03]

(3) අවසාන ශුද්ධ වත්කම් - ආරම්භක ශුද්ධ වත්කම් - අතිරේක ප්‍රාග්ධනය = ලාභය

2 920 000 [01] - 2 200 000 [01] - 600 000 [01] = 120 000

(3) 2017.01.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය රු' 000

| | | | |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | 2 950 | (01) |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 750 (01) | | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 1 400 (01) | | |
| බැංකු ශේෂය | 220 (01) | 2 370 | |
| | | 5 320 | |
| **හිමිකම්** | | | |
| ප්‍රාග්ධනය | | 1 600 | (01) |
| රඳවාගත් ඉපැයුම් | | 1 320 | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| බැංකු ණය | | 1 850 | (01) |
| **ජංගම වගකීම්** | | | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 550 | (01) |
| | | 5 320 | |

(ලකුණු 07)

ප්‍රශ්න අංක 3

| 1 | 2 | 3 | එකතුව |
|---|---|---|---|
| 20 | 03 | 07 | 30 |

ප්‍රශ්න අංක 04

(අ) (1)

වේතන ගිණුම රු' 000

| | | | |
|---|---|---|---|
| වේතන පාලන | 655 (01) | ලාභාලාභ | 655 (01) |
| | 655 | | 655 |

(ලකුණු 02)

(2)

වේතන පාලන ගිණුම රු' 000

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු EPF | 48 (01) | වේතන | 655 |
| සේවක ණය | 120 (01) | | |
| සේවක සුභසාධක අරමුදල | 25 (01) | | |
| මුදල්/ උපචිත වේතන | (01) 462 | | |
| | 655 | | 655 |

(ලකුණු 04)

(3)

EPF වියදම් ගිණුම රු' 000

| | | | |
|---|---|---|---|
| ගෙවිය යුතු EPF | 72 (01) | ලාභාලාභ | 72 (01) |
| | 72 | | 72 |

(ලකුණු 02)

(4)

ගෙවිය යුතු EPF ගිණුම රු' 000

| | | | |
|---|---|---|---|
| මුදල්/ශේෂය ප/ගෙ | 120 (01) | වේතන පාලන | 48 |
| | | EPF වියදම් | 72 (01) |
| | 120 | | 72 |

(ලකුණු 02)

(ආ) (1)

**මුදල් ලැබීම් ජර්නලය** — රු' 000

| දිනය | විස්තරය | දුන් වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු: අත්පිට විකුණුම් | විශ්ලේෂණ තීරු: ණයගැති ලැබීම් |
|---|---|---|---|---|---|
| 17.01.08 | විකුණුම් | | 300 | 300 (01) | |
| 17.01.25 | ඩේවිඩ් | | 400 | | 400 (01) |
| 17.01.30 | නායගම් | 20 | 230 | | 230 (01) |
| | | 20 | 930 | 300 | 630 |

**මුදල් ගෙවීම් ජර්නලය** — රු' 000

| දිනය | විස්තරය | ලද වට්ටම් | වටිනාකම | විශ්ලේෂණ තීරු: අත්පිට ගැනුම් | විශ්ලේෂණ තීරු: ණයහිමි ගෙවීම් |
|---|---|---|---|---|---|
| 17.01.02 | ගැනුම් | | 200 | 200 (01) | |
| 17.01.15 | ගැනුම් | | 400 | 400 (01) | |
| 17.01.18 | නාමල් | 20 | 180 | | 180 (01) |
| 17.01.26 | අනුර | 10 | 290 | | 290 (01) |
| | | 30 | 1070 | 600 | 470 |

(ලකුණු 07)

(2)

(i) **ගැනුම් ගිණුම** — රු' 000

| | | | |
|---|---|---|---|
| මුදල් | 600 | ලාභාලාභ | 1 400 |
| ණයහිමි පාලන | 800 | | |
| | 1 400 | | 1 400 |

(ii) **විකුණුම් ගිණුම** — රු' 000

| | | | |
|---|---|---|---|
| ලාභාලාභ | 1 200 | මුදල් | 300 |
| | | ණයගැති පාලන | 900 |
| | 1 200 | | 1 200 |

(iii) **ණයහිමි පාලන ගිණුම** — රු' 000

| | | | |
|---|---|---|---|
| ආපසු යැවුම් | 100 | ගැනුම් | 800 |
| මුදල් | 470 | | |
| ලද වට්ටම් | 30 | | |
| ශේෂය ප/ගෙ | 200 | | |
| | 800 | | 800 |

(iv) **ණයගැති පාලන ගිණුම** — රු' 000

| | | | |
|---|---|---|---|
| විකුණුම් | 900 | ආපසු එවුම් | 150 |
| | | මුදල් | 630 |
| | | දුන් වට්ටම් | 20 |
| | | ශේෂය ප/ගෙ | 100 |
| | 900 | | 900 |

([illegible] අයිතම දෙකකට එක ලකුණ බැගින් ලකුණු 08)

PADANAMA PUBLICATION

(3) දළ ලාභය ගණනය කිරීම රු' 000

| | | |
|---|---|---|
| විකුණුම් | | 1 200 (01) |
| (-) ආපසු එවුම් | | (150) (01) |
| | | 1 050 |
| <u>විකුණුම් පිරිවැය</u> | | |
| ගැනුම් | 1 400 (01) | |
| (-) ආපසු යැවුම් | (100) (01) | |
| (-) 01/31 දිනට තොගය | (300) (01) | (1 000) |
| දළ ලාභය | | 50 |

(ලකුණු 05)

ප්‍රශ්න අංක 4

| | 1 | 2 | 3 | 4 | එකතුව |
|---|---|---|---|---|---|
| අ | 02 | 04 | 02 | 02 | 10 |
| ආ | 07 | 08 | 05 | - | 20 |
| | | | | | 30 |

PADANAMA PUBLICATION

**ප්‍රශ්න අංක 05**

**(අ)** **(1)** ජංගම අනුපාතය $\underline{3 : 1}$ (02)

| | |
|---|---|
| **පෙරවැඩ** | රු' 000 |
| $\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}} = \frac{1\ 500\ \boxed{01}}{500\ \boxed{01}} = 3 : 1$ | |

**(2)** ණයගැති පිරිවැටුම් අනුපාතය වාර 9 (02)

| | |
|---|---|
| **පෙරවැඩ** | රු' 000 |
| $\frac{\text{ණයට විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}} = \frac{6\ 300\ \boxed{01}}{700\ \boxed{01}} =$ වාර 9 | |

**(3)** හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය $\underline{40\%}$ (02)

| | |
|---|---|
| **පෙරවැඩ** | රු' 000 |
| $\frac{\text{බදු පසු ලාභය}}{\text{හිමිකම}} \times 100 = \frac{1\ 200\ \boxed{01}}{3\ 000\ \boxed{01}} \times 100 = \underline{40\%}$ | |

**(4)** පොලී ආවරණ අනුපාතය වාර 7 (02)

| | |
|---|---|
| **පෙරවැඩ** | රු' 000 |
| $\frac{\text{බදු පෙර ලාභය + පොලී වියදම}}{\text{පොලී වියදම}} = \frac{1\ 800 + 300\ \boxed{01}}{300\ \boxed{01}}$ X ~~100~~ = වාර 7 | |

**(5)** වත්කම් පිරිවැටුම් අනුපාතය වාර 1.4 (02)

| | |
|---|---|
| **පෙරවැඩ** | රු' 000 |
| $\frac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}} = \frac{6\ 300\ \boxed{01}}{4\ 500\ \boxed{01}} =$ වාර 1.4 | |

(ලකුණු 10)

PADANAMA PUBLICATION

(ආ)(1) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගිණුම රු' 000

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 400 | වියදම් | 1 370 |
| සාමාජික මුදල් | 1 050 (01) | ස්ථාවර තැන්පත් | 1 500 (01) |
| පිහිනුම් තටාකය හා ක්‍රීඩාගාර භාවිතය සඳහා ලැබීම් | 640 (03) | ශේෂය ප/ගෙ | (01) 90 |
| පිහිනුම් තටාක කුලී ආදායම | 870 (02) | | |
| | 2 960 | | 2 960 |

(ලකුණු 08)

**පෙරවැඩ** රු' 000

පිහිනුම් තටාක හා ක්‍රීඩාගාර භාවිතය

| | | |
|---|---|---|
| 1 000 X 30 X 6 | = 180 | 01 |
| 1 000 X 20 X 8 | = 160 | 01 |
| 500 X 60 X 10 | = 300 | 01 |
| | 640 | |

මුදලින් ලද පිහිනුම් තටාක කුලී

| | | |
|---|---|---|
| 3 X 150 000 | = 450 | 01 |
| 2 X 150 000 | = 300 | |
| 150 000 X 80% | = 120 | 01 |
| | 870 | |

(2) 2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය රු' 000

| | | |
|---|---|---|
| **ආදායම්** | | |
| සාමාජික මුදල් | 900 (02) | |
| පිහිනුම් තටාකය හා ක්‍රීඩාගාර ආදායම | (01) 640 | |
| පිහිනුම් තටාක කුලී ආදායම | 750 (01) | |
| ස්ථාවර තැන්පත් පොලිය | 135 (01) | 2 425 |
| **වියදම්** | | |
| වියදම් | 1 370 (01) | |
| ක්ෂය | 750 (01) | (2 120) |
| අතිරික්තය | | (01) 305 |

(ලකුණු 08)

**පෙරවැඩ** රු' 000

සාමාජික මුදල් ආදායම

| | | |
|---|---|---|
| 60 X 10 000 | = 600 | |
| 30 X 10 000 X 75% | = 225 | 01 |
| 15 X 10 000 X 50% | = 75 | 01 |
| | 900 | |

හෝ

| | | |
|---|---|---|
| වර්ෂය තුල ලද සාමාජික මුදල් | 1 050 | 01 |
| කලින් ලද සාමාජික මුදල් | (150) | 01 |
| | 900 | |

පිහිනුම්-තටාක කුලී ආදායම

| | | |
|---|---|---|
| 3 X 150 000 | = 450 | 01 |
| 2 X 150 000 | = 300 | |
| | 750 | |

හෝ

| | | |
|---|---|---|
| මුළු මුදල් ලැබීම් | 870 | |
| අත්තිකාරම | (120) | 01 |
| | 750 | |

(3) 2017.03.31 දිනට වගකීම් රු' 000

කලින් ලද සාමාජික මුදල් 150 (02)

කලින් ලද පිහිනුම් තටාක කුලී ආදායම 120 (02) (ලකුණු 04)

ප්‍රශ්න අංක 5

| | 1 | 2 | 3 | 4 | 5 | එකතුව |
|---|---|---|---|---|---|---|
| අ | 02 | 02 | 02 | 02 | 02 | 10 |
| ආ | 08 | 08 | 04 | - | - | 20 |
| | | | | | | 30 |

PADANAMA PUBLICATION

**ප්‍රශ්න අංක 06**

**(අ) (1)**

(රු.' 000)

| වසර | 0 | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|---|
| **<u>මුදල් ගලාඒම්</u>** | | | | | | |
| විකුණුම් ආදායම | | 1 000 | 1 000 | 1 000 | 1 200 | 1 200 |
| සුන්බුන් අගය | | | (01) | | (01) | 200 (01) |
| | | 1 000 | 1 000 | 1 000 | 1 200 | 1 400 |
| **<u>මුදල් ගලායාම්</u>** | | | | | | |
| යන්ත්‍ර පිරිවැය | (1 200) (01) | | (01) | | | (01) |
| ප්‍රාථමික පිරිවැය | | (500) | (500) | (500) | (600) | (600) |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | | (100) | (100) | (100) (01) | (100) | (100) |
| | 1 200 | 600 | 600 | 600 | 700 | 700 |
| ශුද්ධ මුදල් ප්‍රවාහය | (1 200) | 400 | 400 | 400 | 500 | 700 |
| 10% වට්ටම් සාධකය | 1 | 0.91 | 0.83 | 0.75 | 0.68 | 0.62 |
| ශුද්ධ මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය (01) | (1 200) | 364 | 332 | 300 | 340 | 434 |
| ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය | | | | | | 570 |

**(ලකුණු 08)**

**(2)** ශුද්ධ වර්තමාන අගය ධන බැවින් ව්‍යාපෘතිය පිළිගැනීම යෝග්‍ය වේ. (02)

**(ලකුණු 02)**

(ආ) සීමිත රවිඳු පොදු සමාගම

2017.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (රු' 000)

| | | |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| බදු පෙර ලාභය | 3 000 (01) | |
| ක්ෂය | 1 200 (01) | |
| පොළී වියදම | 1 300 (01) | |
| දේපළ, පිරියත සහ උපකරණ විකුණුම් මත ලාභ | (700) (01) | |
| | 4 800 | |
| තොග අඩුවීම | 1 000 (01) | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ වැඩිවීම | (1 000) (01) | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ වැඩිවීම | 2 000 (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් | 6 800 | |
| පොළී ගෙවීම් | (300) (01) | |
| ආදායම් බදු ගෙවීම් | (2 100) (01) | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | | (01) 4 400 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනුම් | (16 000) (02) | |
| දේපළ, පිරියත සහ උපකරණ විකුණුම් | 5 600 (02) | |
| ආයෝජන ක්‍රියාකාරකම් වල යෙදවූ ශුද්ධ මුදල් | | (01) (10 400) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | |
| කොටස් නිකුත් කිරීම | 8 000 (01) | |
| බැංකු ණය ගෙවීම | (1 000) (01) | |
| ලාභාංශ ගෙවීම | (900) (01) | |
| මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ජනනය වූ ශුද්ධ මුදල් | | (01) 6 100 |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම | | 100 |
| 2016.04.01 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 1 900 |
| 2017.03.31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | | 2 000 (01) |

(ලකුණු 20)

**පෙරවැඩ** රු' 000

දේපළ, පිරියත සහ උපකරණ ගිණුම

| | | | |
|---|---|---|---|
| ශේෂය ඉ/ගෙ | 30 000 | දේ.පි.උ.විකුණුම් | 9 000 |
| මුදල් | 16 000 | ශේෂය ප/ගෙ | 37 000 |
| | 46 000 | | 46 000 |

දේපළ, පිරියත සහ උපකරණ විකුණුම් ගිණුම

| | | | |
|---|---|---|---|
| දේ.පි.උ. | 9 000 | සමුච්චිත ක්ෂය | 4 100 |
| ලාභාලාභ | 700 | මුදල් | 5 600 |
| | 9 700 | | 9 700 |

**අයිතම දෙකකට එක බැගින් ලකුණු** 02

**අයිතම දෙකකට එක බැගින් ලකුණු** 02

**ප්‍රශ්න අංක 6**

| | 1 | 2 | එකතුව |
|---|---|---|---|
| අ | 08 | 02 | 10 |
| ආ | - | - | 20 |
| | | | 30 |

ප්‍රශ්න අංක 07

(ඇ) (1) යළි ඇනවුම් මට්ටම - කිලෝග්‍රෑම් 5 600/280 (02)

**පෙරවැඩ**

උපරිම පරිභෝජනය X උපරිම පොරොත්තු කාලය

| | |
|---|---|
| 800 [01] X 7 [01] | $\frac{800}{20}$ [01] X 7 [01] |
| කිලෝග්‍රෑම් 5 600 | 280 |

(2) අවම තොග මට්ටම - කිලෝග්‍රෑම් 1 400/ 70 (03)

**පෙරවැඩ**

යළි ඇනවුම් මට්ටම - (සාමාන්‍ය පරිභෝජනය X සාමාන්‍ය පොරොත්තු කාලය)

| | |
|---|---|
| [01] 5600 - (700 [01] X 6) [01] | [01] 280 - $\frac{700}{20}$ [01] X 6) [01] |
| කිලෝග්‍රෑම් 1 400 | 70 |

(3) උපරිම තොග මට්ටම - කිලෝග්‍රෑම් 6 600/4 130 (03)

**පෙරවැඩ**

යළි ඇනවුම් මට්ටම - (අවම පරිභෝජනය X අවම පොරොත්තු කාලය) + යළි ඇනවුම් ප්‍රමාණය

| | |
|---|---|
| [01] 5600 - (600 X 5) + 4 000 [01] | [01] 280 - ( $\frac{600}{20}$ X 5) + 4 000 [01] |
| [01] | [01] |
| කිලෝග්‍රෑම් 6 600 | 4 130 |

(4) සාමාන්‍ය තොග මට්ටම කිලෝග්‍රෑම් 4 000/2 100 හෝ කිලෝග්‍රෑම් 3 400/ 2 070 (02)

**පෙරවැඩ**

$\frac{\text{උපරිම තොග මට්ටම + අවම තොග මට්ටම}}{2}$

| | |
|---|---|
| [01] $\frac{6\,600 + [01]\ 1\,400}{2}$ | [01] $\frac{4\,130 + [01]\ 70}{2}$ |
| කිලෝග්‍රෑම් 4 000 | 2 100 |

**පෙරවැඩ**

අවම තොග මට්ටම + $\frac{\text{යළි ඇණවුම් ප්‍රමාණය}}{2}$

| | |
|---|---|
| [01] 1 400 + $\frac{4\,000}{2}$ } [01] | [01] 70 + $\frac{4\,000}{2}$ } [01] |
| කිලෝග්‍රෑම් 3 400 | 2 070 |

(ලකුණු 10)

(ආ) (1) මාසික මුළු ස්ථාවර පිරිවැය — රු.

| | රු. | |
|---|---|---|
| බලපත්‍ර ගාස්තුව | 50 000 | (01) |
| සුපරීක්ෂක වැටුප් | 80 000 | (01) |
| කුලිය $\frac{360\ 000}{12}$ | 30 000 | (01) |
| රක්ෂණය | 40 000 | (01) |
| උපදේශක ගාස්තු | 100 000 | (01) |
| | 300 000 | |

(2) මුළු පිරිවැය ආවරණය කර ගැනීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන 10 (03)

**පෙරවැඩි**

$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} = \frac{[01]\ 300\ 000}{50\ 000\ [01] - 20\ 000\ [01]} = 10$

(3) රු.150 000 ක ලාභයක් ඉපයීම සඳහා මාසිකව විකිණිය යුතු පරිගණක ගණන 15 (03)

**පෙරවැඩි**

$\frac{\text{ස්ථාවර පිරිවැය + අපේක්ෂිත ලාභය}}{\text{ඒකක දායකය}} \quad \frac{[01]\ 300\ 000 + 150\ 000\ [01]}{[01]\ 30\ 000} = 15$

(4) ඒකක මත වැටුප වෙනුවට එකළස් සේවකයන්ට රු.80 000 ක මුළු මාසික වැටුපක් ගෙවන්නේ නම් මුළු පිරිවැය ආවරණය කිරීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන 10 (04)

**පෙරවැඩි**

$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} \quad \frac{[01]\ 300\ 000 + 80\ 000\ [01]}{50\ 000\ [01] - 12\ 000\ [01]} = 10$

(5) එකලස් අංශය ස්වයංක්‍රීය කිරීම තුළින් මුළු පිරිවැය ආවරණය කිරීමට මාසිකව විකිණිය යුතු පරිගණක ගණන 9 (05)

**පෙරවැඩි**

$\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක දායකය}} \quad \frac{[01]\ 300\ 000 + 15\ 000\ [01]}{50\ 000 - (3\ 000 + 12\ 000)} = \frac{315\ 000}{35\ 000} = 9$

[01] [01] [01]

(ලකුණු 20)

ප්‍රශ්න අංක 7

| | 1 | 2 | 3 | 4 | 5 | එකතුව |
|---|---|---|---|---|---|---|
| අ | 02 | 03 | 03 | 02 | - | 10 |
| ආ | 05 | 03 | 03 | 04 | 05 | 20 |
| | | | | | | 30 |

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්
### සිංහල මාධ්‍ය

**විද්‍යා - ගණිත**

- [ ] 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- [ ] 12-13 රසායන විද්‍යාව - 1
- [ ] 12-13 රසායන විද්‍යාව - 2
- [ ] 12-13 රසායන විද්‍යාව - 3
- [ ] 12-13 රසායන විද්‍යාව - 4
- [ ] 12-13 රසායන විද්‍යාව - 5
- [ ] 12-13 භෞතික විද්‍යාව - 1
- [ ] 12-13 භෞතික විද්‍යාව - 2
- [ ] 12-13 භෞතික විද්‍යාව - 3
- [ ] 12-13 භෞතික විද්‍යාව - 4
- [ ] 12-13 භෞතික විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 1
- [ ] 12-13 ජීව විද්‍යාව - 2
- [ ] 12-13 ජීව විද්‍යාව - 3
- [ ] 12-13 ජීව විද්‍යාව - 4
- [ ] 12-13 ජීව විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- [ ] 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 1
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 2
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 3
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 4

**වාණිජ්‍යය**

- [ ] 12 ගිණුම්කරණය
- [ ] 13 ගිණුම්කරණය
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 13 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව
- [ ] 13 ආර්ථික විද්‍යාව - 1
- [ ] 13 ආර්ථික විද්‍යාව - 2

**කලා**

- [ ] 12 සිංහල
- [ ] 13 සිංහල
- [ ] 12 දේශපාලන විද්‍යාව
- [ ] 13 දේශපාලන විද්‍යාව
- [ ] 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 12 ඉන්දියානු ඉතිහාසය
- [ ] 13 ඉන්දියානු ඉතිහාසය
- [ ] 12 භූගෝල විද්‍යාව
- [ ] 13 භූගෝල විද්‍යාව
- [ ] 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes
### English Medium

- [ ] 12 Accounting
- [ ] 13 Accounting
- [ ] 12 Business Studies
- [ ] 13 Business Studies
- [ ] 12 Economics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර
### සිංහල මාධ්‍ය

- [ ] සාමාන්‍ය දැනීම
- [ ] 12 ගිණුම්කරණය - 1
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.